රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.05.24**

**නිවේදන අංකය: 503/2021**
**නිකුත් කළ වේලාව:17.30**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ**
**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු**

**සංචරණ සීමා ජුනි 07 දක්වා දීර්ඝ කෙරේ.**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී අද (24) පැවති කොවිඩ් මර්දන කමිටු රැස්වීමේදී කොවිඩ් 19 ව්‍යාප්තිය පාලනය කරනු පිණිස පහත සඳහන් තීරණ ගනු ලැබීය.

- 2021.05.25 අඟහරුවාදා (හෙට) අළුයම 04.00 සිට රාත්‍රී 11.00 දක්වා සංචරණ සීමා ලිහිල් කෙරේ.
- හෙට (25) විවෘතව තැබිය හැක්කේ සිල්ලර වෙළෙඳසැල්, ඖෂධ සල්, මාළු, මස්, එළවළු සහ බේකරි නිෂ්පාදන වෙළෙඳසැල් පමණි.
- මත්පැන් අලෙවිසැල් සම්පූර්ණයෙන් වසා තැබේ.
- අහාර ද්‍රව්‍ය හා ඖෂධ වැනි අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීමට නිවසකින් එක් අයෙකුට පමණක් ආසන්නම වෙළෙඳ සැලට යාමට අවසර ලැබේ.
- හෙට (25) නිවසින් බැහැරවීමට හැඳුනුම්පතේ අවසන් අංකය මත පදනම් වූ ක්‍රමය අදාල වන්නේ නැත.
- කුමන හේතුවක් නිසා හෝ පෞද්ගලික වාහන වලින් වෙළෙඳසල් වෙත ගමන්කළ නොහැකිය.
- හෙට (25) රාත්‍රී 11.00 සිට මැයි 31 අළුයම 04.00 දක්වා නැවතත් සංචරණ සීමා ක්‍රියාත්මක කෙරේ.
- මැයි 31 සඳුදා අළුයම 04.00 සිට රාත්‍රී 11.00 දක්වා සංචරණ සීමා ලිහිල් කරනු ලැබේ.
- මැයි 31 සඳුදා රාත්‍රී 11.00 ට නැවත පැනවෙන සංචරණ සීමා ජුනි 04 දා සිකුරාදා අළුයම 04.00 දක්වා ක්‍රියාත්මකව පවතී.
- ජුනි 04.00 සිකුරාදා අළුයම 04.00 සිට රාත්‍රී 11.00 දක්වා සංචරණ සීමා යළි ලිහිල් කෙරේ.
- ජුනි 04 සිකුරාදා රාත්‍රී 11.00ට නැවත පැනවෙන සංචරණ සීමා ජුනි 07 සඳුදා අළුයම 04.00 දක්වා බලපැවැත්වෙයි.
- සංචරණ සීමා පනවා ඇති කාල සීමාවතුල ජනතාවට අත්‍යවශ්‍ය අහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ පහසුව සඳහා ප්‍රාදේශීය මට්ටමින් ජංගම වෙළඳරථ යොදවනු ලැබේ.
- ගුවන් හමුදාව ඩ්‍රෝන තාක්ෂණය යොදාගනිමින් සංචරණ සීමා කඩ කරන්නන් දිනපතා නිරීක්ෂණය කරයි.

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**